
10 ශ්‍රේණිය නම වන ඒකක දත්ත සමුදාය විෂය කරුණු තක්සේරු කිරීම (තුන්වන කොටස)

පහත 1 සිට 6 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරට අදාළ අක්ෂරය වරහන් තුළින් තෝරා ලියන්න

( A. එක - එක  B. එක - බහු  C. බහු - බහු )


1. වගුවක එක් රෙකෝඩයක් වෙනත් වගුවක එක් රෙකෝඩයක් සමග සම්බන්ධ වන්නේ නම් පමණක් එම වගු දෙක අතර පවතින සම්බන්ධතාවය ____________________සම්බන්ධතාවක් ලෙස හැඳින්වේ.
2. වගුවක එක් එක් රෙකෝඩ සම්බන්ධිත වගුවේ රෙකෝඩ කිහිපයක් සමග සම්බන්ධ වන්නේ නම් එම වගු දෙක අතර පවතින සම්බන්ධතාව __________________________ සම්බන්ධතාවක් ලෙස හැඳින්වේ.
3. එක් වගුවක රෙකෝඩයක් වෙනත් වගුවක රෙකෝඩ කිහිපයක් සමග සම්බන්ධ වන්නේ නම් සහ එම සම්බන්ධිත වගුවේ රෙකෝඩයක් අනෙක් වගුවේ රෙකෝඩ කිහිපයක් සමග සම්බන්ධ වන්නේ නම් නම් එම වගු දෙක අතර පවතින සම්බන්ධතාව _________________________ සම්බන්ධතාවක් ලෙස හැඳින්වේ.
4. මෙම රූපයෙන් දැක්වෙන සම්බන්ධතාව කුමක්ද?




5. මෙම රූපයෙන් දැක්වෙන සම්බන්ධතාව කුමක්ද?




6. පහත රූප සටහනෙන් දැක්වෙන සම්බන්ධතාව කුමක්ද?



පහත ප්‍රකාශය හොඳින් කියවා 7 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න
ඒක-බහු සම්බන්ධතාව සලකා A සහ B වගු දෙකේ ***B යනු සම්බන්ධිත වගුව නම්*** පහත ප්‍රකාශ විය හැකිද නොහැකිද යන්න තෝරන්න.

P - හැකිය

Q - නොහැකිය

7. A වගුවේ එක් රෙකෝඩයකට B වගුවේ රෙකෝඩ කිහිපයක් සමග සම්බන්ධ විය හැකිද?
8. B වගුවේ එක් රෙකෝඩයකට A වගුවේ එක් රෙකෝඩයක් සමග පමණක් සම්බන්ධ විය හැකිද ?
9. A වගුවේ ප්‍රාථමික යතුර අඩංගු තීරුවේ දත්ත අනුපිටපත් ____________
10. B වගුවේ ආගන්තුක යතුර අඩංගු තීරුවේ දත්ත අනුපිටපත් ________________

පහත දක්වා ඇත්තේ ව්‍යාපාරික තොරතුරු පද්ධතියක් සම්බන්ධිත දත්ත සමුදාය කොටසක් බව උපකල්පනය කරන්න. මෙම ව්‍යාපාරයට රටෙහි විවිධ ප්‍රදේශයන්හි ඇති සමහර කළාප කාර්යාලවල වෙළෙඳසැල් පවතී.

පහත වගු සලකා බලා 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න

විකුණුම් වගුව (Sales Table)

| Month | ShopID | Sales |
|---|---|---|
| January | 0001 | 13500 |
| February | 0001 | 19800 |
| March | 0003 | 16440 |
| April | 0001 | 12340 |
| May | 0002 | 17440 |

කාණ්ඩ වගුව (Category Table)

| Category | Items |
|---|---|
| A | Ice Cream & Short eats |
| B | Milk |
| C | Stationary |

ශාඛා වගුව (Branch Table)

| Name | ShopID | Category |
|---|---|---|
| Galle ZEO | 0001 | A |
| Udugama ZEO | 0002 | B |
| Matara ZEO | 0003 | C |

(සැ.යු 11,12 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේදී දී ඇති උපදෙස් පිළිපදින්න.

උදා : (ප්‍රාථමික යතුර,වගුව) පිළිතුර මේ අකාරයෙන් ලියන්න.)

11. ප්‍රාථමික (Primary Key) යතුරක් ඒවාට අදාළ වගුව සමග ලියා දක්වන්න.

12. ආගන්තුක (Foreign Key) යතුරක් ඒවාට අදාළ වගුව සමග ලියා දක්වන්න.

13. එක් එක් වෙළෙඳසැලේ දුරකථන අංකය ඇතුළත් කිරීමට වෙනස් කළ යුතු වගුව වරහන් තුලින් තෝරා ලියන්න.

A. Sales Table B. Category Table C. Branch Table )

14. ShopID 0004 නමින් නව වෙළෙඳසැලක් Short eats & Photocopy අලෙවිය සඳහා අකුරැස්ස කළාපයේ විවෘත කළේ යයි උපකල්පනය කර මෙම තොරතුරු ඇතුළත් කිරීමට යාවත්කාලීන කළ යුතු මොනවාද?

( සැ.යු පිළිතුරු සැපයීමේදී දී ඇති උපදෙස් පිළිපදින්න.

උදා : (වගුව,වගුව,වගුව) පිළිතුර මේ අකාරයෙන් ලියන්න. )

15. ශාඛා වගුව සහ විකුණුම් වගුව අතර ඇති සම්බන්ධතාව වරහන් තුලින් තෝරා ලියන්න. A

(A. එක-එක B. එක-බහු C. බහු-බහු)

පහත වගු සලකා බලා 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

Order table

| order_id | customer_id | order_date | amount |
|---|---|---|---|
| 555 | 101 | 12/24/09 | 156.78 |
| 556 | 102 | 12/25/09 | 99.99 |

Item table

| Item_id | Item_name |
|---|---|
| 201 | DVD |
| 202 | CD |
| 203 | Pen Drive |

Item_order table

| Order_id | Item_id |
|---|---|
| 555 | 201 |
| 555 | 202 |
| 556 | 202 |
| 556 | 203 |

16. ප්‍රාථමික (Primary Key) යතුරු දෙකක් ඒවාට අදාළ වගු සමග නිවැරදිව සටහන් වන්නේ කුමන පිලිතුරේද?

A. order_id : Order table , Item_id : Item table

B. order_id : Item_order table , Item_id: Item_order table

17. ආගන්තුක (Foreign Key) යතුරු දෙකක් ඒවාට අදාළ වගු සමග නිවැරදිව සටහන් වන්නේ කුමන පිලිතුරේද?

A. order_id : Order table , Item_id : Item table

B. order_id : Item_order table , Item_id: Item_order table

18. අයිතම විස්තරය (item description) ඇතුළත් කරන්නේ නම් එය ඇතුළත් කළ යුත්තේ කුමන වගුවටද?

A. Item_order table

B. Item table

19. Item_id: 204, Item_name: power bank නම් නව අයිතමයක් එකතු කරන්නේ නම් එය යාවත්කාලීන කළ යුතු වගුව කුමක්ද?

A. Order table

B. Item table

20. Item table සහ Item_order table අතර ඇති සම්බන්ධතාව තෝරා ලියන්න.

(A. එක-එක B. එක-බහු C. බහු-බහු)

21 සිට 23 දක්වා ප්‍රශ්න සඳහා පහත වගු උපයෝගී කරගෙන පිළිතුරු ලියන්න.

පිළිතුරු සැපයීමේදී දී ඇති උපදෙස් පිළිපදින්න.
උදා : (ප්‍රාථමික යතුර,වගුව) පිළිතුර මේ අකාරයෙන් ලියන්න.)

රියදුරු වගුව (Driver Table)

| Driver_ID | Name | Root | Bus_ID |
|---|---|---|---|
| EMP0001 | Saman | Colombo-Galle | CG00015 |
| EMP0012 | Nimal | Kandy-Kurunagala | KK00028 |
| EMP0013 | Weerarathna | Colombo-Matara | CM00038 |
| EMP0022 | Sunil | Kandy-Jaffna | KJ0001 |

බස් වගුව (Bus Table)

| Bus_ID | Name |
|---|---|
| KJ0001 | Damrajina |
| CG00015 | Nadeeka |
| KK00028 | Jayanath |
| CM00038 | Lakmal |

21. ප්‍රාථමික යතුරක් ඊට අදාළ වගුව සමග ලියන්න.

22. ආගන්තුක (Foreign Key) යතුරක් ඒවාට අදාළ වගුව සමග ලියා දක්වන්න.

23. Bus_ID = TC00052, Name = Nilambara නම් නව රෙකෝඩයක් එකතු කරන ලද්දේ නම් යාවත්කාලීන කළ යුතු වගු මොනවාද?

සැ.යු: පිළිතුර මේ ආකාරයෙන් ලියන්න. (වගුව,වගුව)

24 හා 25 ප්‍රශ්න සඳහා පහත වගුව ආධාරයෙන් පිළිතුරු ලියන්න.

දත්ත වගුව (Details Table)

| NIC | Postal_Code | Name | Vehicle_ID | Num_of_Passengers |
|---|---|---|---|---|
| 789456123V | 80000 | Uditha | CAR_7859 | 5 |
| 896541237V | 35000 | Suresh | BUS_5432 | 50 |
| 698745123V | 60000 | Dimuthu | CAB_2589 | 6 |
| 783214569V | 40000 | Chandiv | CAR_7859 | 5 |

24. ප්‍රාථමික යතුර සඳහා යෝග්‍ය ක්ෂේත්‍රය කුමක්ද?

25. ආගන්තුක යතුර සඳහා යෝග්‍ය ක්ෂේත්‍රය කුමක්ද?

***